# INFORMATION SYSTEMS (Part - VII)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# පරිගණක ජාල

පරිගණක ජාල යනු පණිවිඩ, දත්ත හා තොරතුරු හුවමාරු කිරීම ආදි කාර්ය ඉටුකර ගැනීමට පරිගණක 2ක් හෝ ඊට වැඩි ගණනක් සම්බන්ධ කොට පොදුවේ කටයුතු කරන විට එම පද්ධතිය පරිගණක ජාලයක් ලෙස හැඳින්වේ.

පරිගණක ජාල ප්‍රධාන වර්ග දෙකකි.

1. ප්‍රදේශීය පරිගණක ජාල (LAN )
2. පුළුල් ක්ෂේත්‍ර පරිගණක ජාල ( WAN)

ClassWork.LK

# අන්තර්ජාලය

අන්තර්ජාලය පුළුල් ක්ෂේත්‍ර පරිගණක ජාලයකි. අන්තර්ජාලය යන්න පහත අයුරින් හඳුන්වා දිය හැකි ය. පුළුල් පරාසයක් ආවරණය කරමින් සකස් කරනු ලබන පරිගණක ජාලයකි.

ලෝකය පුරා ව්‍යාප්ත වී ඇති පරිගණක ජාල දහස් ගණනක් සම්බන්ධ වී තොරතුරු හුවමාරු වන කවර වේලාවක වුව ද සම්බන්ධ විය හැකි ක්‍රියාකාරකම් සහිත තත්ත්වයක් අන්තර්ජාලය ලෙස හැඳින්වේ.

ClassWork.LK

# අන්තර්ජාලය මගින් සපයනු ලබන සේවා

- **ලෝක ව්‍යාප්ත ජාල පහසුකම්** (W.W.W.)

ජාලමය පරිගණක තොරතුරු වර්ග කිරීම, නැවත ලබා ගැනමී , පළි ි යළ කරී ම සහ ප්‍රදර්ශනය කිරීම සඳහා වූ ලෝක සම්මත ප්‍රමිතිය යටතේ වූ පද්ධතිය ලෝක ව්‍යාප්ත ජාලය ලෙස හඳුන්වයි.

අන්තර්ජාලයේ වෙනත් අයට නැරඹීම / කියවීම සඳහා ගබඩා කර ඇති කෝටි ගණනක් වූ විද්‍යුත් ලේඛනවල එකතුවක් ලෙස ද ලෝක ව්‍යාප්ත ජාලය හැඳින්විය හැකි ය. ලෝක ව්‍යාප්ත ජාලයට පිවිසීමට වෙබ් බ්‍රවුසරයක් (මෘදුකාංගයක්) මගින් හැකියාව ලැබේ.

**උදා :**

Internet Explorer, Netscape ලෝක ව්‍යාප්ති ජාලයේ වෙබ් අඩවි සොයා ගැනීම සඳහා සෙවුම් යන්ත්‍ර (Search Engines) උපකාරී වේ.

**නිදසුන්** Google, Yahoo, MSN

ClassWork.LK

- **විද්‍යුත් තැපෑල ( e-mail)**

සංනිවේදන සම්බන්ධකයක් (Link) හරහා පරිගණකයකින් පරිගණකයකට පණිවුඩ හුවමාරු කර ගැනීම විද්‍යුත් තැපෑල වේ. විද්‍යුත් පණිවිඩයක් යැවීම සඳහා යවන්නාට හා ලබන්නාට අන්තර්ජාල පහසුකම් හා විද්‍යුත් තැපැල් ලිපියොමු (e-mail Addrese ) තිබිය යුතු ය. විද්‍යුත් තැපෑල මඟින් ඡායාරූප, ලේඛන, චිත්‍ර, හඬ, සජීවකරණ යනාදිය යැවිය හැකිය.

- **ගොනු හුවමාරු නියමාවලිය ( File Transfer Protocol)**

අන්තර්ජාලයට සම්බන්ධ පරිගණක අතර අන්‍යෝන්‍ය පරිගණක ගොනු හුවමාරුව සඳහා වන ක්‍රමයකි. විවිධ ක්ෂේත්‍රවල තොරතුරු ඇතුළත් ලේඛන, ගීත, චිත්‍රපට, පරිගණක ක්‍රීඩා ආදිය ඇතුළත් ගොනු පිටපත් කර ගැනීමට, හුවමාරු කර ගැනීමට මේ ක්‍රමයේ ඉඩ ලැබේ.

ClassWork.LK

- **කථන පහසුකම් (VOIP-Voice Over Interne Protocacol)**

ලොව පුරා විසිරී සිටින පුද්ගලයින්ට තම නිවසේ සිට ම එකිනෙකා අතර කථා කිරීමට හා අදහස් හුවමාරු කර ගැනීමට සපයා ඇති පහසුකමකි. මෙම පහසුකම මඟින් පහත සඳහන් ක්‍රම ඔස්සේ අදහස් හුවමාරු වේ.

- අදහස් ටයිප් කර අනෙක් පාර්ශ්වයට යැවීම (ලිඛිත කථන) (Text Chatting )
- වාචික ව අදහස් හුවමාරු කර ගැනීමට (හඬ කථන) (Voice Chatting)
- වෙබ් කැමරා භාවිත කරමින් ශබ්දයට අමතරව දර්ශන හුවමාරු කර ගැනීමට (වීඩියෝ කථන) (Vedio Chatting) නිදසුන් Skype

ClassWork.LK

- **VOIP-Voice Over Interne Protocacol**

Text + Sound + Vedio+ Files හුවමාරු කිරීමට හැකිය.

- **ප්‍රවෘත්ති කණ්ඩායම් (News Group)**

සමාන රුචිකම් ඇති කණ්ඩායම්වලට තොරතුරු ලබා ගැනීමට හා අදහස් හුවමාරු කර ගැනීම ට හා තොරතුරු ලබා ගැනමී ට සපයන පහසුකමකි. තම රුචිය ඇති කේෂේත්‍රය වෙනුවෙන්
සැකසුණු ප්‍රවෘත්ති කණ්ඩායමක සාමාජිකත්වය ලබා ගත්විට අන්තර්ජාලය මගින් ස්වයංක්‍රීයව ක්ෂේත්‍රයේ නව දැනුම හා තොරතුරු ලැබීමට සලස්වයි.

ClassWork.LK

- **ටෙලි පරිගණක (Tele Computing )**

එක් ස්ථානයක ඇති පරිගණකයක් මඟින් අන්තර්ජාලයට සම්බන්ධ වී තවත් ස්ථානයක ඇති පරිගණකයක් භාවිත කිරීමට පහසුකම් සැලසීම ටෙලි පරිගණක සේවය යි. මේ මඟින් යම් අයකුට තම නිවසේ පරිගණකය මඟින් පිවිස තම කාර්යාලයයේ පරිගණකය භාවිත කළ හැකිය

## <u>දෛනික කටයුතු සඳහා පුද්ගලයෙකුට අන්තර්ජාලය මඟින් ලබා ගත හැකි පහසුකම්</u>

- විද්‍යුත් තැපැල් පහසුකම්
- වෙබ් අඩවි නැරඹීම
- අන්තර්ජාල සංවාද
- දූරකථන පහසුකම්
- ලිපිගොනු හුවමාරුව

ClassWork.LK

- විද්‍යුත් රැස්වීම්, රූපවාහිනිය, ගුවන් විදුලි විකාශනයන් නැරඹීමේ පහසුකම්
- ඊ-පුවත් හා ඊ-සඟරා, ඊ-පුස්තකාල පහසුකම්
- ඊ-චැනල් සේවය

## <u>ආයතනයක කාර්ය පහසු කරලීමට ද අන්තර්ජාලය යොදා ගත හැකි ය.</u>

- විද්‍යුත් වාණිජ කටයුතු සඳහා.
- භාණ්ඩ හා සේවා පිළිබඳ ව ප්‍රචාරණය කිරීම කළ හැකි වීම.
- තම තරගකරුවන් පිළිබඳ අවශ්‍ය කෙරෙන වැදගත් තොරතුරු ක්ෂණික ව ලබා ගත හැකි වීම.

ClassWork.LK

- සන්නිවේදන පිරිවැය අවම වන ලෙසට යොදා ගැනීම.

- තමා සතු වෙළෙඳ පොළ ලෝකය පුරා ව්‍යාප්ත කිරීමට.

- තොරතුරු පහසුවෙන් හා වේගවත් ව ලබා දීමට

- ව්‍යාපාර ආයතන සමාජ ජාල උපකාර කර ගනිමින් තම ව්‍යාපාර කටයුතු සිදු කිරීම.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550


S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura